// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2270/70 – 2022 මාර්තු 11 වැනි සිකුරාදා – 2022.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/44.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.07.09 දිනැති හා අංක 2183/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.03.13 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් ගම්පහ, මුදුන්ගොඩ, විජේසේකර මාවත, අංක 131/22 හි පදිංචි එම්. එස්. ජී. නාවලඇල්ල මයා. සහ මල්වාන, වල්ගම, බියගම අපනයන සැකසුම් කලාපය, බ්ලොක් ''ඒ'', ලොට් 15 හි පිහිටි ලුමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.01.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 පෙබරවාරි මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය: IR/COM/04/2019/44.

### කාර්මික අධිකරණය

නඩු අංකය: A33/2020

එම්. එස්. ජී. නාවලඇල්ල මයා.
අංක 131/22,
විජේසේකර මාවත,
මුදුන්ගොඩ, ගම්පහ.

*පළමු පාර්ශවය*



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එදිරිව
ලූමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලොට් 15, බ්ලොක් "A",
බියගම අපනයන සැකසුම් කලාපය,
වල්ගම, මල්වාන.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා ආරවුල

**ප්‍රදානය**

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 (01) (1968 අංක 39 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2020.03.13 වන දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට එකී ආරවුල මා වෙත යොමුකර ඇත.

**ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ -**

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගයට අමුණා ඇති කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ 2019.12.31 දිනැති ලිපියට අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ ''ලූමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් ආයතනයේ සේවය කරන ලද එම්. එස්. පී. නාවලඇල්ල මහතාට පත්වීම් ලිපියේ සඳහන් පරිදි පහත සඳහන් දීමනා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.

1. 2014.09.15 දින සිට 2015.12.31 දින දක්වා හා 2016 අප්‍රේල් සහ මැයි මාස සඳහා වාහන දීමනාව
2. 2014.09.15 දින සිට 2016.05.31 දින දක්වා රියදුරු දීමනාව
3. 2015 අගෝස්තු සිට 2015 දෙසැම්බර් දක්වා හා 2016 අප්‍රේල්, මැයි මාස සඳහා ඉන්ධන දීමනාව

ඒ අනුව ඉහත සඳහන් පරිදි 1, 2, 3 වශයෙන් සඳහන් දීමනා ලබානොදීමෙන් පළමුවන පක්ෂයට අසාධාරණයක් සිදු වී තිබේද? තිබේනම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්න මෙම නඩුවේ විසඳිය යුතු කරුණු වශයෙන් දක්වා ඇත.

මෙම පරීක්ෂණය ආරම්භයේදීම පළමුවන පාර්ශවය විසින් කාර්මික අධිකරණය වෙත මෙම පැමිණිල්ලට අදාළව පැ. 1 සිට පැ. 3 දක්වා ලේඛන ද සමඟ 2020 ක් වූ ජූලි මස 30 වන දින ඔහුගේ නඩුවට අදාළ සවිස්තර ප්‍රකාශයක් ගොනු කර ඇත. ඒ අනුව ඔහු ඉල්ලා ඇත්තේ පහත සඳහන් හිඟ ගෙවීම් තමාට ලබාදෙන ලෙසටයි.

| | | |
|---|---|---|
| 1. 2014 සැප්තැම්බර් මස සිට 2015 දෙසැම්බර් මස දක්වා සහ 2016 අප්‍රේල් සහ මැයි මාස සඳහා වාහන දීමනාව | 50,000/= x 17 ½ | 875,000/= |
| 2. 2015 අගෝස්තු මස සිට 2015 දෙසැම්බර් සහ 2016 අප්‍රේල් සහ මැයි මාස සඳහා ඉන්ධන දීමනාව | 30,000/= x 7 | 210,000/= |
| 3. 2014 සැප්තැම්බර් මස සිට 2016 මැයි මස සඳහා රියදුරු දීමනාව | 25,000/= x 20.5 | 512,000/= |
| එකතුව | | 1,597,000/= |

දෙවන පාර්ශවය 2020.08.04 වන දින කළමනාකාර ට්‍රෙවින් පෙරේරා (Travin Perera) මහතා මගින් ප්‍රකාශයක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ,

පළමුවන පාර්ශවයට ඉන්ධන දීමනාවක් සඳහා හිමිකම් නොලබන බවත්, චෝදනා රාශියක් සම්බන්ධයෙන් 2016 ජූනි මස 02 වන දින පටන් සේවයෙන් පහ කර ඇති බවත්, අනතුරුව 2016 අගෝස්තු 01 දාතමින් හේතු විමසන ලද ලිපියක් නිකුත් කර ඇති බවත්ය. 2016 අගෝස්තු 09 වන දින පළමු පක්ෂය හේතු ඉදිරිපත් කර තිබුණ ද, ඒවා සතුටුදායක නොවන බැවින් පළමු පක්ෂයේ සේවය අවසන් කරන්නට යෙදුණු බව ද ප්‍රකාශ කර ඇත. අවසාන වශයෙන් දෙවන පක්ෂය සඳහන් කර ඇත්තේ කිසිදු ගෙවීමක් හිඟව නැති බවත්, පැමිණිලිකරු විසින් එම කරුණු ඔප්පු කළ යුතු බවට තරයේ කියා සිටින බවත්ය.

කෙසේ වෙතත් 2021.04.01 දින මෙම නඩුව හරස් ප්‍රකාශ ගොනු කිරීම සඳහා අමතන ලද අවස්ථාවේ දී ඉදිරිපත්ව ඇති කරුණු අනුව සමථයක් ඇති කර ගැනීම පහසු නොවන්නේ දැයි බේරුම්කරණය විසින් යෝජනා කළ අතර, එහිදී දෙවන පක්ෂය කියා සිටියේ ඉන්ධන දීමනාව පළමු පක්ෂයට හිමි දීමනාවක් නොවන බවයි. පළමු පක්ෂය ප්‍රකාශ කර සිටියේ සියළු ගෙවීම් ලබා දෙන්නේ නම් සමථයක් ඇති කරගත හැකි බවයි. පත්වීම් ලිපිය අනුව පළමුවන පක්ෂයට ඉන්ධන දීමනාව පිළිබඳව සඳහන් නොවන බව ද පරීක්ෂා කිරීමේ දී පෙනී යයි. කෙසේ වෙතත් අවස්ථා දෙකකදී ඉන්ධන ලබා දී ඇති හෙයින් ඒ පිළිබඳව ප්‍රතිබන්ධනයවීමක් ඇති බවට තර්ක කළ හැකි වුවද සාධාරණත්වය අනුව ලැබුණු මුදල් අමතර වාසියක් සේ සළකා එය අතහැර සමථයකට පත්වන ලෙස යෝජනා කරන ලදුව දෙපක්ෂයම ඊට එකඟ සේ සළකා කටයුතු කරන ලෙස යෝජනා කරන ලදී. ඒ අනුව පළමු පක්ෂය ඉන්ධන දීමනාව අත් හරින්නේ නම් සෙසු දීමනා කොටස් වශයෙන් ලබාදීමේ හැකියාවක් පවතින බව දෙවන පක්ෂය ප්‍රකාශ කර සිටියි.

පළමු පාර්ශවය ප්‍රකාශ කර සිටියේ ඉන්ධන දීමනාව ද අවස්ථා ගණනක දී ගෙවා ඇති බැවින් එම දීමනාව ද ලබාදෙන ලෙස ඉල්ලා සිටියි. කෙසේ වෙතත් අධිකරණයේ යෝජනාව අනුව එය අතහැර සමථයකට පැමිණීමට පළමු පක්ෂය කැමැත්ත ප්‍රකාශ කරන බව ද ප්‍රකාශ කරන ලදී.

සේවක පළමු පක්ෂයේ දිවුරුම් ප්‍රකාශයේ උපලේඛනය අනුව සහ කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමු ලිපියේ සඳහන් විසඳිය යුතු ප්‍රශ්නවලට අනුව,

1. වාහන දීමනාව
   2014 සැප්තැම්බර් මස සිට 2015 දෙසැම්බර් මස දක්වා
   සහ 2016 අප්‍රේල් සහ මැයි මාස සඳහා වාහන දීමනාව 50,000/= x 17 ½ 875,000/=

2. රියදුරු දීමනාව
   2014 සැප්තැම්බර් මස සිට 2016 මැයි මස සඳහා
   රියදුරු දීමනාව 25,000/= x 20.5 512,000/=

3. ඉන්ධන දීමනාව
   ඉන්ධන දීමනාව පත්වීම් ලිපියට අනුව ගෙවිය යුතු දීමනාවක් නොවන අතර අතපසුවීමකින් අවස්ථා කීපයක් ඒවා ගෙවා තිබීම මත එකී මුදල අමතර වාසියක් සේ සළකා එම දීමනාව අතහැර සමථයක් සඳහා යෝජනා කරන ලද අතර, එකී දීමනාව දිගින් දිගටම ගෙවා නැති හෙයින් ඒ මත ප්‍රතිබන්ධනයවීමක් ද නැති සේ සළකා දෙපක්ෂයම සමථයට එකඟ වන්නේ නම් මෙම නඩුව අවසන් කළ හැකි බව බේරුම්කරණයෙන් යෝජනා කරන ලදුව දෙපක්ෂයම ඊට එකඟතාවය පළ කරන්නට යෙදුණි. දෙවන පක්ෂය වැඩිදුරටත් ඉල්ලා සිටියේ පවතින ආර්ථික තත්ත්වය හමුවේ මෙම සමථයට අනුව ගෙවිය යුතු මුළු මුදල වන රු. 13,87,000/- ක මුදල වාරික 18 කින් ගෙවීමට අවසර ඉල්ලා සිටින බවයි. එය ද කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සාධාරණීකරණය කළ යුතු තත්ත්වයක් සේ පෙනී යයි. පළමු පක්ෂය ද එකී ඉල්ලීමට එකඟත්වය එකී කරුණ මත පළ කර සිටී. ඒ අනුව දෙපක්ෂයේ එකඟතාවයෙන් ඇති කරන්නට යෙදුණු මෙම සමථය සාධාරණ සහ යුක්ති සහගත සමථයක් වශයෙන් තීරණය කරමි.

## ප්‍රදානය

මා ඉදිරියේ දී පවත්වන ලද සමස්ත විමසීම් සහ ඉදිරිපත් කරන ලද ලේඛන සළකා බැලීමේදී වගඋත්තරකාර දෙවන පක්ෂය ඔවුන්ගේ නීති නිළධාරි එම්. ඒ. සී. ට්‍රෙවින් පෙරේරා මහතා මගින් පෙනී සිටිමින් ඔවුන්ගේ නීතිඥ මහතා පැමිණ නැති බව දන්වා සිටි අතර, ඔහු ප්‍රකාශ කර සිටියේ පළමු පක්ෂය විසින් ඉල්ලා ඇති රු. 15,97,000/- ක මුදලින් ඉන්ධන දීමනාව වශයෙන් දෙලක්ෂ දස දහසක (රු. 210,000/-) ක මුදල අතහැර ශේෂ වන රුපියල් දහතුන් ලක්ෂ අසූ හත් දහසක (රු. 13,87,000/-) මුදල 2021 ජූලි මාසයේ 25 වන දින සිට ඊළඟ මාසයේ 10 වන දිනට පෙර පළමු වාරිකය ගෙවිය හැකි බවත්, ඒ ආකාරයෙන් වාරික දහ අටකින් (18) කින් ගෙවීමට අදාළ මාසයේ විසිපස් (25) වන දින සිට ඊළඟ මාසයේ දහවන (10) දින අතරතුර කාලයේ දී ගෙවීමේ පොරොන්දුව මත සමථයකට එළඹිය හැකි බවයි. ඒ ආකාරයෙන් ගෙවන්නේ නම් පළමු පක්ෂය ද සමථයකට එළඹිය හැකි බව ප්‍රකාශ කර සිටී. ඒ අනුව පළමු පක්ෂය සහ දෙවන පක්ෂය සමාදානයෙන් මෙම නඩුව අවසන් කර ගැනීමට එකඟවන අතර, ඒ අනුව වාරික ගෙවීමට කටයුතු කරන ලෙස දෙවන පක්ෂයට නියෝග කරමි. එසේම පළමු පක්ෂයට ඒ ආකාරයෙන් වාරික ලබාගන්නා ලෙසට නියෝග කරමි. මෙම ගෙවීමට අදාළ පළමු වාරිකය 2021 ජූලි මස විසිඅට (28) වන දින මෙම අධිකරණයේ දී ම ගෙවීමට හැකි බව ද ප්‍රකාශ කරන ලදී. ඒ අනුව 2021.07.28 වන දින එකී මුදල දෙවන පක්ෂය විසින් පළමුවන පක්ෂයට ලබාදෙන ලද අතර, ඒ ආකාරයෙන් ඉදිරි වාරික ඉහත ප්‍රදානයේ සඳහන් පරිදි මාසිකව ගෙවන ලෙසට දෙවන පාර්ශවයටත් එකී මුදල් ලබාගන්නා ලෙස පළමු පාර්ශවයටත් නියෝග කරමි. ගෙවීම් සම්බන්ධයෙන් යම් කිසි අතපසුවීමක් හෝ මග හැරීමක් සිදුවුවහොත් අදාළ කම්කරු කාර්යාලයට දැනුම් දී නීතිමය පියවර ගන්නා ලෙස ද නියෝග කරමි.

මෙම නියෝගය සාධාරණ සහ යුක්තිසහගත තීන්දුවක් බව ද ප්‍රකාශ කර සිටිමි.

**සටහන**

මෙම නඩුව විමසා අවසන්ව ගෙවීම් ආරම්භ කළ ද ප්‍රදානයට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූයේ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවස්ථා ගණාවක දී ම රට වසා තැබීමත් ප්‍රදානය යතුරුලියනය කර ගැනීමට තිබූ බලවත් අපහසුතාවයන් හේතුවෙන් බව ප්‍රකාශ කරන අතර, ඒ පිළිබඳ බලවත් සේ කණගාටු වන බව ද ප්‍රකාශ කර සිටිමි.

විතාරණගේ ජයරත්න,
බේරුම්කරු.

2022 ජනවාරි මස 15 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

EOG 03 – 0847

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.